| | |
|---|---|
| | **මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය** |
| | දෙවන වාර ඇගයීම - 2024 |
| 7 **ශ්‍රේණිය** | **බුද්ධ ධර්මය** |

නම/ විභාග අංකයඃ ........................................ කාලය පැය 2 යි

**I කොටස**

- **උපදෙස් - 01 - 20 දක්වා ප්‍රශ්නවලට ගැලපෙන පිළිතුර යටින් ඉරක් අඳින්න.**

1) බුද්ධ ශාසනයේ බුදුන් හා දහම් සරණ ගිය පළමු (ද්වේවාචික) උපාසකවරුන් වන්නේ,
   i. පස්වග තවුසන් ය.
   ii. යසකුල පුත්‍රයා ඇතුලු යහළුවන් ය.
   iii. තපස්සු භල්ලුක වෙළඳ දෙබෑයෝ ය.
   iv. ජටිල සහෝදරයෝ ය.

2) පස්වග තවුසන් රහත්බව ලැබූ සූත්‍රය වන්නේ,
   i. දම්සක් පැවතුම් සූත්‍රය
   ii. අනන්ත ලක්ඛන සූත්‍රය
   iii. වසල සූත්‍රය
   iv. කරණීය මෙත්ත සූත්‍රය

3) පෙර භවයකදී කළ අකුසලයක් හේතුවෙන් දරුණු රෝගයකට ගොදුරු වූයේ,
   i. සුනාපරත්න පුණ්ණ හිමි
   ii. උදරාබාධයෙන් පෙළුණු හිමි
   iii. පූතිගත්ත තිස්ස හිමි
   iv. චුල්ලපන්ථක හිමි

4) බුදුරජාණන් වහන්සේ දමනය කළ නොහැකි සියල්ලන් දමනය කිරීමේ හැකියාවෙන් යුක්ත වන හෙයින්,
   i. 'අරහං' නම් වන සේක
   ii. 'ලෝක විදූ' නම් වන සේක
   iii. 'සුගත' නම් වන සේක
   iv. 'අනුත්තරෝ පුරිසදම්ම සාරථී' වන සේක

5) පුද්ගලයෙකුගේ ජීවිතයේ කෙස් සුදු වීම, හම රැළි වැටීම, ඉන්ද්‍රිය දුබල වීම, මිය යාම යන ධධර්මතාවයන් අයත් නියාම ධර්මය වන්නේ,
   i. ධම්ම නියාමය
   ii. බීජ නියාමය
   iii. චිත්ත නියාමය
   iv. උතු නියාමය

6) බුද්ධ ශාසනයේ 'බුද්ධ මාතාව' ලෙසින් ගෞරවාදරයට පත් වූයේ,
   i. යශෝධරා දේවිය
   iii. මහාමායා දේවිය
   ii. මහා ප්‍රජාපතී ගෝතමී තෙරණිය
   iv. උප්පලවණ්ණා තෙරණිය

7) 7 ශ්‍රේණියේ ඉගෙනුම ලබන විමල්, විශ්ව හා පාන්ඩන් හොඳම යාළුවෝය. පාසලේ සෑම පොදු කටයුතු වලදී සහයෝගයෙන් සමඟියෙන් කටයුතු කරයි. මෙය ඔවුන් තුළ පවතින,
   i. කරුණා ගුණයයි
   ii. මුදිතා ගුණයයි
   iii. සහජීවනයයි
   iv. මෛත්‍රී ගුණයයි

8) තම අසරණ මවුපිය දෙපොළට සැලකූ කුරුලු පැටවකුගේ කතාව ඇතුළත් ජාතක කථාව වන්නේ,

i. සාම ජාතකය ii. සාලිකේදාර ජාතකය

iii. තිත්තිර ජාතකය iv. නිමි ජාතකය

9) ඉවසීමෙන් ලැබෙන ආනිසංස ධර්මයක් නොවන්නේ,

i. සතුරන් නැති මිතුරන් බහුල පුද්ගලයෙක් වේ.

ii. අපරාධවලින් තොරව සාමකාමී සහජීවනයෙන් ජීවත් වන කෙනෙක් වේ.

iii. මරණාසන්න මොහොතේදී මුලාවට පත් වී අසතුටෙන් මිය යාම වේ.

iv. දෙව්මිනිසුන්ට හා අමනුෂ්‍යයන්ට ප්‍රිය මනාප කෙනෙක් වේ.

10) ගුරුසිත නොරිදවා - වේලාව නොවරදවා
බැතිපෙම් උපදවා - අකුරු උගනී කුමරු සොඳවා
මෙම කවිය ඇතුළත් ග්‍රන්ථය වන්නේ,

i. සිරිත්මල්දම ii. ලෝවැඩ සඟරාව

iii. සුභාෂිතය iv. කාව්‍යශේකරය

11) මලිඳු පාසලේ ශිෂ්‍යනායකයෙකි. ඔහු තුළ පවතින් නායකත්ව ලක්ෂණයක් නොවන්නේ,

i. දුරදක්නා නුවණින් කටයුතු කිරීම

ii. පූර්ව සූදානම හා සැලසුම් සහගත බව

iii. අප්‍රිය වචනයෙන් කතා කිරීම

iv. නිවැරදි තීරණ ගැනීම

12) සිඟාලෝවාද සූත්‍රයට අනුව ගුරු සිසු යුතුකම් දැක්වෙන්නේ,

i. බටහිර දිශාවෙනි ii. දකුණු දිශාවෙනි

iii. උතුරු දිශාවෙනි iv. නැගෙනහිර දිශාවෙනි

13) ගිහියාගේ ගෘහස්ථ ශීලය වන්නේ,

i. අටසිල් ය ii. දසසිල් ය

iii. පන්සිල් ය iv. උපසම්පදා ශීලය

14) ගොවියා කෘෂිකර්මාන්තයේ නියැලී පළමුවෙන්ම කුඹුරු වලින් ලබා ගන්නා අස්වැන්න ත්‍රිවිධ රත්නයට පූජා කරයි. මෙය හඳුන්වන්නේ,

i. අග්‍රශෂ්‍ය දානය ලෙසය ii. ආමිස දානය ලෙසය

iii. ප්‍රතිපත්ති දානය ලෙසය iv. ධර්ම දානය ලෙසය

15) බුදු සසුනේ අග්‍රදායකතුමා වන්නේ,

i. මිගාර සිටුතුමා ii. අනේපිඬු සිටුතුමා

iii. බරණැස් සිටුතුමා iv. සිරිවඩ්ඪන සිටුතුමා

16) කරණීයමෙත්ත සූත්‍රයට අනුව නිවන් පතන, මෙත් වඩන්නෙකු තුළ තිබිය යුතු උසස් ගුණාංග.

i. 12 කි ii. 16 කි iii. 10 කි iv. 15 කි

17) බුදුරජාණන් වහන්සේ සත් සතිය ගත කරමින් බුද්ධ ශරීරයෙන් සවණක් ගණ බුදුරැස් විහිදෙන්නට පටන් ගත්තේ,

i. දෙවන සතියේය ii. හයවන සතියේය

iii. සිව්වන සතියේය iv. තෙවන සතියේය

18) බුදු දහම පටිසෝතගාමීය. බෞද්ධ දරුවන් වන අප යා යුත්තේ,

i. වෛරයෙන් වෛරයටය
ii. ක්‍රෝධයෙන් අක්‍රෝධයටය
iii. හිංසාවෙන් හිංසාවටය
iv. වරදෙන් වරදටය

19) විශාඛා උපාසිකාව තම මේල පළඳනාව මිල කොට සැවැත්නුවර ඉදිකළ ආරාමය වන්නේ,

i. වේළුවනාරාමය
ii. ජේතවනාරාමය
iii. පූර්වාරාමය
iv. ඝෝෂිතාරාමය

20) සියලු රෝගාබාධ වැලදෙන්නේ කර්මය නිසා නොවන අතර එය එක් හේතුවක් පමණි. ඒ බව දැක්වෙන සූත්‍ර දේශනාව වන්නේ,

i. වසල සූත්‍රය යි
ii. ගිරිමානන්ද සූත්‍රය යි
iii. රතන සූත්‍රය යි
iv. ව්‍යග්ගපජ්ජ සූත්‍රය යි

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නයට ලකුණු 20ක්ද, අනෙකුත් ප්‍රශ්න සඳහා ලකුණු 10 බැගින් ද හිමි වේ.**

1) දෙවන වාරයේ ඔබ විසින් සිදු කළ පාසල් පාදක ඇගයීම් ඇසුරින් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

i. ඔබ ඉටු කළ ඇගයීම කුමක්ද? ඒ කවර පාඩම ඇසුරින් ද?
ii. සාකච්ඡාවට ලක් වූ ප්‍රශ්නයක් හා පිළිතුරක් දක්වන්න.
iii. මිනිසා හා සත්ත්වයා අතර සමානකම් දෙකක් දක්වන්න.
iv. මිනිසා හා සත්ත්වයා අතර අසමානතා දෙකක් ලියන්න.
v. ඔබ සාකච්ඡා කළ කරුණු වලට අනුව ගිහියාට සමාදන් විය හැකි සීලයන් දෙකක් දක්වන්න.
vi. කේලාම් කීමෙන් ඇති වන අනිටු ඵල දෙකක් ලියන්න.
vii. ප්‍රියවචන කතා කිරීමෙන් ලැබෙන ආනිසංස දෙකක් ලියන්න.
viii. සාකච්ඡා මණ්ඩපයෙන් ඔබ දිවියට ඇති වූ වාසි දෙකක් ලියන්න.
ix. සාකච්ඡා මණ්ඩපය කරගෙන යාමට ගුරුතුමාගෙන්/ ගුරුතුමියගෙන් ලැබුණු උපදෙස් දෙකක් ලියන්න.
x. ඔබ කළ සාකච්ඡා මණ්ඩපයෙන් ලබා ගත් දැනුම තුළින් ආදර්ශ පාඨ දෙකක් නිර්මාණය කරන්න.

(ල. 20)

2)

i. බුද්ධ ශාසනයේ පළමු රහත් හැට නම දක්වන්න.
ii. බුදුරජාණන් වහන්සේ පළමු වරට රජගහනුවරට වැඩම කිරීම නිසා බිම්බිසාර රජුගේ බලාපොරොත්තු 5ක් ඉටු විය. ඉන් තුනක් ලියන්න.
iii. බුද්ධ චරිතයෙන් ශිෂ්‍ය ජීවිතයට ලබා ගත හැකි ආදර්ශ පහක් දක්වන්න.

(ල. 10)

3)

i. බුදුරජාණන් වහන්සේ සිඟාලෝවාද සූත්‍රය දේශනා කළේ කාටද?
ii. සිඟාලෝවාද සූත්‍රයට අනුව ගුරුවරයා විසින් ශිෂ්‍යයාට ඉටු කළ යුතු යුතුකම් තුනක් ලියන්න.
iii. ශිෂ්‍යයා විසින් තම ගුරුවරුන්ට සැලකිය යුතු ආකාරය විස්තර කරන්න. (ල. 10)

4)

i. බුද්ධිමත් වෙළඳ නායකයාගේ ක්‍රියා කලාපය නිසා තම පිරිසෙහි ජීවිත ආරක්ෂා කරගත හැකි විය. මෙම කතා පුවත ඇතුළත්වන ජාතක කථාව කුමක්ද?

ii. මෙහි සඳහන් නායකත්ව ගුණාංග තුන දක්වන්න.

iii. ශිෂ්‍ය ජීවිතයේදී ඔබ ගොඩනඟා ගන්නා නායකත්ව ලක්ෂණ පහක් ගෙනහැර දක්වන්න.

(ල. 10)

5)

i. බුද්ධ කාලයේ සුනාපරන්ත ජනපදයට වැඩම කළ භික්ෂූන් වහන්සේ කවුද? ඒ හිමිගේ සුවිශේෂී ගුණාංගය කුමක්ද?

ii. බුදුන් වහන්සේගේ චරිතයෙන් මෙම ගුණාංගය ප්‍රකට වුණු අවස්ථා තුනක් දක්වන්න.

iii. "ඉවසන දනා රුපු යුදයට ජය කොඩිය
මහමෙර උසුලනා මිහිකතටත් වැඩිය" යන පැරණි උපදේශය අනුව ඉවසීම තුළින් සමාජය යහපත් වන අයුරු පහදන්න.

(ල. 10)

6)

i. අටලෝ දහමට අදාල කරුණු දෙක ලියන්න.

ii. බුදුදහමේ ඉගැන්වෙන නියාම ධර්ම තුනක් නම් කරන්න.

iii. සියලුම රෝගාබාධ වැළදෙන්නේ කර්මය නිසාම නොවේ. ඒ සඳහා බලපාන වෙනත් හේතු සඳහන් කරන්න.

(ල. 10)

7)

i. අනේපිඬු සිටුතුමාගේ චරිතයෙන් ඔබට ගත හැකි ආදර්ශ දෙකක් ලියන්න.

ii. ධනංජය සිටුතුමා තම දියණියට යුග දිවිය සාර්ථක කර ගැනීම සඳහා ලබා දුන් අවවාද තුනක් ලියන්න.

iii. විශාඛා උපාසිකාවගේ චරිතයෙන් ඔබට ලබා ගත හැකි ආදර්ශ පහක් ලියන්න.

(ල. 10)